සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 03

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES
පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

කාලය : පැය එකයි

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	
	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	
	V/II/S/CH


- **පහත දී ඇති රූප නිරීක්ෂණය කර අංක 1 සහ 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) කොටුව තුළ ඇති චිත්‍රයට වඩාත් සමාන වන සේ ඇඳ ඇති චිත්‍රය කුමක් ද ?





(1)



(2)



(3)

(2) A රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද ?



A




B

(1) 5 කි. (2) 4 කි. (3) 3 කි.

- **අංක 3 සහ 4 ප්‍රශ්නවල කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය කුමක්ද ?**

(3)





(1)




(2)



(3)

(4)





(1)



(2)



(3)

(5) මෙම රූපය නිවැරදිව සම්පූර්ණ කිරීමට කුමන රූප කොටස එක් කළ යුතු ද ?





(1)




(2)




(3)

(6) කොටුවේ ඇති රූප තුන ම එක් කිරීමෙන් සෑදිය හැකි තනි රූපය කුමක් ද ?



(1) (2) (3)


(7) වීදුරුවකට අයිස් කැට දැමූ විට දැකිය හැකි අවස්ථා අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද ?




A B C


(1) B, C, A (2) A, B, C (3) C, A, B


(8) හිස් කොටුවට ආ යුතු රූපය තෝරන්න.






(9) කොටුව තුළ ඇති කාඩ්පත් පේළියේ ඊළඟට ආ යුතු කාඩ්පත තෝරන්න.





(1) (2) (3)

(10) හැඩ හා සංඛ්‍යා අතර සම්බන්ධය අනුව හිස්තැනට ආ යුතු සංඛ්‍යාව තෝරන්න.



(1) 24 (2) 16 (3) 36

(11) රටාව අනුව හිස් කොටුවට ආ යුතු පිළිතුර තෝරන්න.



(1)  (2)  (3) 

(12) කොටු දැලේ හිස්තැන් දෙකට ආ යුතු සංඛ්‍යා ඇතුළත් පිළිතුර තෝරන්න.


3	18	.....	36
.....	15	24	33
9	12	27	30

(1) 12, 20

(2) 6, 30

(3) 6, 21

(13) පහත දැක්වෙන්නේ විනිවිද පෙනෙන වීදුරු කැබලි දෙකක ඉරි ඇඳ ඇති අයුරු ය.



ඒවා එකමත එක තැබූ විට ලැබෙන ඉංග්‍රීසි අක්ෂර තුන අයත් පිළිතුර කුමක් ද ?

(1) E A T (2) T E K (3) T E M


(14) 2021 වසරේ පෙබරවාරි පළමු දිනට යෙදෙන දවස සඳුදා නම්, එම මස අවසන් දිනට යෙදෙන දවස කුමක් ද ?

(1) සිකුරාදා (2) සඳුදා (3) ඉරිදා

(15) එක ම ගසක වසන නිරෝගී වවුලන් හා ලේනුන් පිරිසකගේ ඇස්වල මුළු එකතුවේ දෙගුණය 16 ක් විය. එහි සිටියේ ලේනුන් ජෝඩුවක් පමණක් නම්, වවුලන් ගණන කීය ද ?

(1) 4 කි. (2) 2 කි. (3) 6 කි.

(16)




මෙහි ඇති මුළු සමචතුරස්‍ර ගණන කීය ද ?

(1) 10 කි.

(2) 11 කි.


(3) 8 කි.

(17) 

මෙහි හිස් කොටුවට ගැළපෙන සංඛ්‍යාව තෝරන්න.

(1) 10 (2) 100 (3) 1

(18) පහත දී ඇති සංඛ්‍යා රටාවේ යොදා ඇති රටාව හඳුනාගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



(1) 12 (2) 4 (3) 8

(19) "වත්තල" යන වචනය සංකේත මගින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1)  (2)  (3) 

(20) 1 සිට 100 තෙක් අංක ලිවීමේ දී 0 ඉලක්කම ලියවෙන වාර ගණන කීය ද ?

(1) 11 (2) 10 (3) 9

(21) සුනිල් වාර පරීක්ෂණයේ දී විෂයයන් හතරකට මුළු ලකුණු 235 ක් ලබා ගෙන තිබුණි. ඔහු ගණිතයට ලකුණු 70 ක් ද පරිසරයට ලකුණු 65 ක් ද ලබා ගෙන තිබුණි. ඉතිරි විෂයයන් දෙකට සමාන ලකුණු ලබා තිබුණි නම්, ඉන් ඒක් විෂයකට ලබාගත් ලකුණු ගණන කීය ද ?


(1) 50 (2) 60 (3) 55

(22) පහත කවියෙන් කියවෙන්නේ කුමක් පිළිබඳව ද ?

පහෙන් කෙනෙකි ලොක්කා නම් වෙන්නේ
වැඩ කෙරුමෙදි මුලට ම ඔහු ඉන්නේ
හතර එකතු කර වැඩක් කරන්නේ
මෙයා නැතොත් හරි වැඩෙනෙ වෙන්නේ

(1) අත (2) ඇඟිලි (3) මහපටැඟිල්ල

(23) ගඩොල් ගොඩක් අසුරා ඇති ආකාරය රූපයේ දැක්වේ. මේ ආකාරයට ගඩොල් 36 ක් තබා ඇත්නම් එහි ඇති තට්ටු ගණන කීය ද ?




(1) 7 (2) 8 (3) 6

(24) සුනිල් 12 cm වූ පටි ගෙන ත්‍රිකෝණයක් ද 9 cm පටි ගෙන සමචතුරස්‍රයක් ද සෑදුවේ ය. මේ දෙකෙහි වටේ දිග පිළිබඳ සත්‍ය පිළිතුර කුමක් ද ?

(1) ත්‍රිකෝණයේ වටේ දිග සමචතුරස්‍රයේ වටේ දිගට වඩා වැඩි ය.
(2) සමචතුරස්‍රයේ සහ ත්‍රිකෝණයේ වටේ දිග සමාන ය.
(3) සමචතුරස්‍රයේ වටේ දිග ත්‍රිකෝණයේ වටේ දිගට වඩා වැඩි ය.

(25) මෙම දැනි රෝද දෙක ම එකවර කැරකීමේ දී අංක 5 ට හමුවන ඉංග්‍රීසි අක්ෂරය කුමක් ද ?




(1) F (2) D (3) E

(26) පත්තර මිටියක් එකට තැබීමට යොදාගත් රබර් පටිය ඇදීමේ දී කලින් තිබූ ප්‍රමාණය මෙන් දෙගුණයක් විය. එය පත්තර මිටියට යෙදූ පසු වටේ දිග 46 cm වුණි නම්, මුලින් තිබූ දිග කීය ද ?

(1) 23 cm (2) 30 cm (3) 92 cm

(27) මෙම දාදු කැටවල රූප තුන ම එක ම දාදු කැටයේ පිහිටීම් තුනකි. එහි 1 ට හා 2 ට විරුද්ධ පැතිවල සංඛ්‍යාවන් පිළිවෙලින් ඇති පිළිතුර කුමක් ද ?



(1) 5,6 (2) 3,4 (3) 4,3


(28) පිළිවෙළින් නිල්, කහ, රතු සහ සුදු ලෙස පාට හතරකින් වැලක කොඩි 50 ක් එල්ලා ඇත. අග සිට 36 කොඩියේ පාට කුමක් ද ?

(1) සුදු පාට (2) රතු පාට (3) කහ පාට

(29) සෙල්ලම් කාරයක් ගමන් කළ මඟක රූප සටහනක් පහත දැක්වේ.

A - ආරම්භක ස්ථානය

B - අවසන් කළ ස්ථානය



සෙල්ලම් කාරය ධාවනය වීමේ දී එය දකුණු පැත්තට හැරුණු වාර ගණන වම් පැත්තට හැරුණු වාර ගණන මෙන්,

(1) දෙගුණයකි (2) සිව් ගුණයකි (3) තෙගුණයකි

(30) කමල් ඡායාරූපයක් දෙස බලා මෙහි පෙනී සිටින්නේ තම පියාගේ පියාගේ එක ම පුතු බව කියයි. එම ඡයාරූපයේ පෙනී සිටිය හැක්කේ,

(1) කමල්ගේ පියා (2) කමල් (3) කමල්ගේ බාප්පා


(31) සිසිර පිට්ටනියක වට බාගයක් දුවන විට අමර වටයක් පසු කර නැවත සිසිරට එකතු වෙයි. අමරගේ වේගය සිසිරගේ වේගය මෙන්,

(1) තෙගුණයකි (2) සිව් ගුණයකි (3) දෙගුණයකි

(32) තරිඳු ළඟ බීම වැඩිපුර තිබුණු අතර කවිඳු ළඟ ඊට අඩුවෙන් තිබුණි. දෙදෙනා ම තම බීම පරිමාවන් බාගය බැගින් හුවමාරු කළේ නම්, දෙදෙනා ළඟ දැන් ඇති බීම පරිමාවන් ගැන නිවැරදිව කියවෙන පිළිතුර කුමක්ද?

(1) තරිඳුට වඩා වැඩි බීම පරිමාවක් කවිඳුට ඇත.
(2) කවිඳුට වඩා වැඩි බීම පරිමාවක් තරිඳුට ඇත.
(3) දෙදෙනා ළඟ ම ඇති බීම පරිමාවන් සමාන ය.

(33) රූපයේ ඇති මුළු ත්‍රිකෝණ ගණන කීය ද ?



(1) 10 කි. (2) 8 කි. (3) 9 කි.

(34) පේළි 20 ක් ඇති පියගැට පෙළක විමල් පළමු පඩියේත් අමල් අවසන් පඩියේත් සිටිති. විමල් පඩිය බැගින් ඉහළ නඟින අතර අමල් පඩි දෙක බැගින් පහළට බසියි. දෙදෙනා ම මුහුණට මුහුණ මුණ ගැසෙන පඩි දෙක වන්නේ, මුල සිට,

(2) 9 සහ 10 (2) 8 සහ 7 (3) 7 සහ 8

(35) සමන්ත ළඟ ඇති මුදලේ තෙගුණයට වඩා රුපියල් 50.00 ක් වැඩියෙන් ජයන්ත ළඟ ඇත. ජයන්ත ළඟ ඇති මුදල රුපියල් 200.00 නම්, සමන්ත ළඟ ඇති මුදල කීය ද ?

(1) රුපියල් 75.00 (2) රුපියල් 50.00 (3) රුපියල් 100.00

(36) A ලෙස දක්වා ඇති කඩදාසිය නැවූ පසු B ලෙස දිස්වීමට එය නැවිය යුතු අඩු ම වාර ගණන,




(1) තුනකි.
(2) හතරකි.
(3) දෙකකි.

(37) හාල් කිලෝග්‍රෑමයක මිල රුපියල් 110.00 ක් නම්, ග්‍රෑම් 100 ක මිල කීය ද ?

(1) රුපියල් 11.00 කි. (2) රුපියල් 55.00 කි. (2) රුපියල් 35.00 කි.

(38)



+ = රුපියල් 280.00

- = රුපියල් 170.00


පිත්තෙහි මිල වන්නේ,

(1) රුපියල් 200.00 කි. (2) රුපියල් 225.00 කි. (2) රුපියල් 250.00 කි.

(39) නංගී ළඟ වෙරළු ගෙඩි 17 ක් ද අක්කා ළඟ වෙරළු ගෙඩි 27 ක් ද ඇත. දෙදෙනා ළඟ ඇති වෙරළු ගෙඩි ගණන සමාන වීමට අක්කා නංගීට දිය යුතු වෙරළු ගෙඩි ගණන කීය ද ?

(1) 7 කි. (2) 10 කි. (2) 5 කි.

(40) කුඩා ගණක රාශියක් මෙම රූපයෙන් දැක්වේ. මෙය සම්පූර්ණ විශාල ගණකයක් කිරීම සඳහා තව එකතු කළ යුතු කුඩා ගණක ගණන කීය ද ?



(1) 6 කි. (2) 4 කි. (3) 5 කි.

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026
පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 03

EXAMINATION FOR GRADE FIVE STUDERNTS FOR SELECTION TO SCHOOL AND FOR THE AWARD OF BURSARIES

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

කාලය : පැය එකයි මී. 15

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

පිටු අංකය	ලැබූ ලකුණු
02	
03	
04	
05	
06	
07	
08	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමු පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	
	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	
	V/II/S/CH

(01) පහත ඡේදය කියවා පිළිතුරු ඡේදය ඇසුරෙන් ම ලියන්න.

හැම විට මට දයාවෙන් හා කරුණාවෙන් සැලකූ මේ පාසලේ, තලතුනා වියෙහි වූ ප්‍රධානාචාර්යතුමා කුඩා කල ම, මගේ සිත් පහන් කළ වැඩිහිටියන් තුන් හතර දෙනාගෙන් එක්කෙනෙකි. එතුමා මට විශේෂ ආදරයක් දැක් වූයේ, මා උගැන්මෙහි සමත් කීකරු දරුවකු වූ නිසා ම නොවේ. මා කිසි කලක බොරු නොකියන්නෙකැයි යන හැඟීමක් ද ඔහු තුළ වූ බැවිනි. ඒ වග දැන සිටි මම, දඬුවම් ලැබිය යුතු වරදක් කළ විට වුව ද ඇත්ත සඟවාගෙන බොරු කීමට නොසිතුවෙමි. එහෙත් දඬුවම් ලැබීමට මා තුළ හටගත් භය නොව ලජ්ජාව නිසා වරක් මම එතුමාට බොරුවක් කීවෙමි. බොරුවක් කීමෙන් මා දඬුවමින් බේරුණු නමුදු, වරද කිරීමට මා පෙලඹ වූ අනෙක් ළමයින් දෙදෙනා වේවැල් පාර කනු දුටු මා තුළ හටගත් වේදනාවත්, ලජ්ජාවත් මහත් වූයෙන්, මම එවේලේ ම හඬන්නට වීමි. නුඹ හඬන්නේ කුමක් නිසා දැ යි ගුරුතුමා දෙතුන් වරක් විචාළ විට මම ඇත්ත හෙළි කළෙමි.

අපේ ගම - මාර්ටින් වික්‍රමසිංහ

(i) තලතුනා වියෙහි වූයේ කවුරුන්ද ? .....

(ii) ඡේදයේ සඳහන් අතීත කාල ඒක වචන ක්‍රියා පදයක් සොයා ලියන්න .....

(iii) ප්‍රධානාචාර්යතුමා මෙම දරුවාට විශේෂ ආදරයක් දැක්වූයේ ඇයි ? .....

.....

(iv) මෙම දරුවා තුළ වේදනාවක් හා ලැජ්ජාවක් ඇතිවූයේ ඇයි ? .....

.....

(v) මෙම ඡේදයෙහි සඳහන් ප්‍රධානාචාර්යතුමාගේ හොඳ ලක්ෂණයක් ලියන්න.

.....

(vi) මෙම ඡේදයේ සඳහන් සඤ්ඤක අක්ෂරයක් යෙදුණු පදයක් තෝරා ලියන්න. .....

(ලකුණු 1 x 6 = 06)

(02) ඒක වචන අතීත කාල ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) බලයි . (2) නැටුවෝ ය . (3) කැඩුවේ ය.

(03) පහත සඳහන් වචනවල **ඉරි ඇඳි අකුරේ** ඇති පිල්ලම නම් කරන්න.

(i) **බෝ**තලය - .....

(ii) ක**රු**ණාව - .....

(04) පහත සඳහන් වැකි හරි නම් (✓) ලකුණද, වැරදි නම් (✗) ලකුණද වරහන් තුළ යොදන්න.

(i) අපි ලස්සනට අකුරු ලියමි. ( )

(ii) වෛද්‍යවරු රෝගීන්ට ප්‍රතිකාර කරති. ( )

(iii) ඔහු ඉරිදා උදේ පොළට යති. ( )

(iv) දිය ඇලි කඳුකරයේ අසිරිය වැඩි කරති. ( )

(05) හිස්තැනට සුදුසු අකුර කොටුව තුළින් තෝරා ලියන්න. **ණ , න , ළ , ල**

(i) ර ..... විරුවා (ii) සු ..... ඟ (iii) ආස ..... ය (iv) සමන **..... යා**

(06) පහත ප්‍රස්තාව පිරුළෙහි අර්ථය නිවැරදිව ලියන්න.

ඉඟුරු දීලා මිරිස් ගත්තා වගේ **.....**

(07) පහත දී ඇති ඉඟි වැකියට ගැළපෙන අදහස ලියන්න.

ඉහේ මලක් පිපුණා .....

(08) පහත දී ඇති එක් එක් වගන්තිය සඳහා ගැළපෙන උක්ත පදය වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න. **(නංගී / තාත්තා / ළමයි)**

(i) ..... ක්‍රීඩා පිටියේ සෙල්ලම් කරති.

(ii) ..... බෝනික්කා නැළවූවා ය.

(iii) ..... උදෑසන ම රැකියාවට පිටත්ව ගියේ ය.

(09) දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ගොඩනගා ලියන්න.

(i) ඉතා / පාසල් / පිට්ටනියකි / ක්‍රීඩා / කෙළවරක / භූමියේ / විශාල

.....

(ii) හරි ම / ඉදිරිපස / ඇති / බිම් / කොටස / අපූරුය / නිවස

.....

(ලකුණු 1 x 18 = 18)

(10) එක් එක් පින්තූරයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i)  .....

(ii)  .....

(11) එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

(1) Rainbow - ..... (2) Pumpkin - .....

(12) පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකිය බැගින් ලියන්න.

(i) is / He / nine / old / years .....

(ii) a / much / is / pen ? / How .....

(ලකුණු 1 x 6 = 06)

(13) ''මළසලකුඩම්'' යන වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න. .....

(14) පහත වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මම එළියට යන්න ද ? .....

(ලකුණු 1 x 2 = 02)

ගැටලු විසඳා පිළිතුරු හිස්තැනෙහි ලියන්න.

(15) 6999ට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව කීය ද? .....

(16) දී ඇති සංඛ්‍යාවට පෙර හා පසු සංඛ්‍යාව ලියන්න. ..... 2099 .....

(17) දී ඇති ඉලක්කම් හතර භාවිත කර එකිනෙකට වෙනස් සංඛ්‍යා තුනක් සාදා එම සංඛ්‍යා තුන ආරෝහණ පිළිවෙළට ලියන්න

6 , 8 , 9 , 4

.....


(18) 9kg බර සහල් මල්ලකින් 5kg 600g ප්‍රමාණයක් විකුණූ පසු ඉතිරි ප්‍රමාණය කොපමණද?

.....

(19) එක් ගොඩක පොල් 428 කි. එවැනි ගොඩවල් 4 ක ඇති පොල් ගණන සොයන්න.

.....

(20) පහත ඝන වස්තුව සම්බන්ධයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.



(i) ඝන වස්තුවේ නම - ..... .

(ii) මුහුණත් ගණන - .....

(21) පහත සංඛ්‍යා රටාවල ඊළඟට ආ යුතු සංඛ්‍යා දෙක ලියන්න.

(i) 198, 194, 190, ... , ...

(ii) 510, 505, 500, ... , ...

(22) පහත දී ඇති භාණ්ඩයේ වටිනාකම මුදල් නෝට්ටු හතරකින් හා කාසියකින් ගෙවිය හැකි ආකාරයක් ලියන්න.



රුපියල්275.00 - .....


(23) ජලය 3*l* 700*ml* ක් දැමිය හැකි භාජනයක් ද 4*l* 350*ml* ක් දැමිය හැකි භාජනයක් ද තිබේ. මෙම භාජන දෙක ම සම්පූර්ණයෙන් ම ජලය පුරවා ඇත්නම් භාජන දෙකේ ම ඇති මුළු ජල පරිමාව කොපමණ ද? .....


(24) රුපියල් 120.00 කට කෝප්පයක් ද රුපියල් 254 .50 කොස්සක් ද මිලදී ගත්විට ගෙවිය යුතු මුළු මුදල රුපියල් කීය ද? රුපියල් .....

(25) ළිඳක් කැපීමට දින දෙකක් ගත විය. පළමු දිනයේ දී 4m 75cm ගැඹුරට ද දෙවන දිනයේ දී 2m 80cm ගැඹුරට ද කපන ලදී. දින දෙක අවසන් වන විට ළිඳ කොපමණ ගැඹුරකට කපා තිබේ ද?


……..

(26) පහත රූපවල ඇඳිය හැකි සමමිතික අක්ෂ සියල්ල ම අඳින්න.

(i) 


(ii) 

(27) දී ඇති වේලාව පහත ඔරලෝසු මුහුණතෙහි ඇඳ පෙන්වන්න.




7.50

(28) පහත රූපයෙන් $\frac{6}{8}$ ක් පාට කරන්න.



(29) පන්තියක ළමයි කැමති පලතුරු වර්ග පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.



(i) මිදිවලට කැමති ළමයින් සංඛ්‍යාවට සමාන වන්නේ කුමන පලතුරු වර්ගවලට කැමති ළමයි ගණනේ **එකතුව ද?** ……

(ii) මෙහි සඳහන් මුළු ළමයි සංඛ්‍යාව කොපමණ ද? .....

(ලකුණු 2 x 15 = 30)

නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(30) ජලය මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය වේ. දිනපතා නියමිත ප්‍රමාණයට ජලය පානය කිරීමෙන්,

(1) තොල් වේළීම සිදුවේ. (2) හම වියළී යයි. (3) සිරුර මලානික නොවේ.

(31) ප්ලාස්ටික් බෝතල් ආදියෙහි විශේෂයෙන් සඳහන් වන මෙම රූපික ප්‍රකාශනයේ අදහස වන්නේ,



(1) භාවිතයට නුසුදුසුය යන්නයි. (2) ප්‍රතිචක්‍රීකරණය කළ හැකිය යන්නයි.
(3) භාවිතය සීමා කළ යුතුය යන්නයි.

(32) කාල නියමයක් නොමැතිව මල් හට ගන්නා ශාකයක් වන්නේ මින් කුමක් ද?

(1) ඇහැළ (2) බිනර (3) කෙසෙල්

(33) **''කෝෂගත වීම සමනලයාගේ ජීවන චක්‍රයේ එක් අවස්ථාවකි.''** මෙම ප්‍රකාශය,

(1) සත්‍ය වේ (2) අසත්‍ය වේ. (3) සමහරවිට සත්‍ය වේ.

(34) හැඟීම් ප්‍රකාශ කරන රූපික ප්‍රකාශනයක් වන මෙම රූපික ප්‍රකාශනයෙන් කියැවෙන අදහස වන්නේ



(1) දුක (2) සතුට (3) කෝපය


(35) කුඩා සතෙකු වන මදුරුවාගෙන් බෝවන රෝග නිසා වාර්ෂිකව මියයන ප්‍රමාණය ඉතා අධික ය.
එසේ මදුරුවන් මගින් බෝවන රෝගයක් වන්නේ,

(1) පාචනය (2) මැලේරියාව (3) කොළරාව

(36) ජනප්‍රිය ගායකයෙකුවන සුනිල් එදිරිසිංහ මහතා ගයන ගීයක් වන්නේ මින් කුමක් ද?

(1) වෙරළු ගෙඩිය හරි අටකට කපාගෙන (2) ගමට කලින් හිරු මුලුතැන්ගෙට වඩනා
(3) හොඳ හොඳ ළමයින් අපි වාගේ

(37) ශ්‍රී ලංකාවට උදාර සේවයක් සිදු කළ මෙම රූපයේ දැක්වෙන ශ්‍රේෂ්ඨ පුද්ගලයා කවුද?



(1) ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මහතා.
(2) ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා.
(3) ශ්‍රීමත් පොන්නම්බලන් රාමනාදන් මහතා.

(38) ශ්‍රී ලංකා ජාතික කොඩියෙහි, තැඹිලි පාට හා කොළ පාට තීරුවලින් නියෝජනය කරනු ලබන්නේ,

(1) දමිළ, මුස්ලිම් ඇතුළු අනෙකුත් ජාතීන් ය. (2) දමිළ, සිංහල ඇතුළු අනෙකුත් ජාතීන් ය.
(3) සිංහල,මුස්ලිම් ඇතුළු අනෙකුත් ජාතීන් ය.

(39) බිය ජනක නාදයක් නිකුත් කරමින් රාත්‍රී කාලයේ දී සැරිසරන පක්ෂියෙකු වන්නේ,

(1) උලමා ය. (2) කෑරලා ය. (3) පිළිහුඩුවා ය.

(40) ශාරීරික හා මානසික සුවය සඳහා වන සූර්ය නමස්කාරය සිදුකළ යුත්තේ,

(1) රාත්‍රියට (2) උදෑසන (3) සවසට

(41) පැපොල රෝගය බෝවනු ලබන්නේ මින් කුමන ක්‍රමය අනුව ද?

(1) මදුරුවන් දෂ්ට කිරීමෙනි. (2) අපිරිසිදු ජලය හා ආහාර ගැනීමෙනි.
(3) රෝග වාහක පුද්ගලයන් මගිනි.

(42) ආර්ථික වාසි ලබා දෙන නිෂ්පාදනයක් සිදුකරන සත්ත්වයෙක් වන්නේ,

(1) මී මැස්සා (2) සමනලයා (3) පළඟැටියා


(43) වගාවලට හානිකරන ගොළුබෙල්ලා ආහාරයට ගන්නා ගොවියාට ප්‍රයෝජනවත් සතෙකි,

(1) මුගටියා (2) ඇටිකුකුළා (3) ඉත්තෑවා

(44) **''ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා''** මෙම අදහස පිළිබිඹු වන්නේ ශ්‍රී ලංකාවේ,

(1) ජාතික ගීයෙනි. (2) රාජ්‍ය ලාංඡනයෙනි. (3) ජාතික කොඩියෙනි.

(45) ගෙවතු වගාවේදී භාවිත කරන මෙම උපකරණය වන්නේ,



(1) මුල්ලුව (2) අලවංගුව (3) රේක්කය

(46) වෛද්‍යවරයා විසින් රෝගියාට නියම කරන ලද බෙහෙත් පානය කිරීමට පෙර සලකා බැලිය යුතු වැදගත් ම කරුණ වන්නේ,

(1) බෙහෙතේ මිල (2) බෙහෙත නිෂ්පාදිත ආයතනය (3) වේලකට ගත යුතු ප්‍රමාණය

(47) පුද්ගලයෙකු දියෙහි ගිලුණු අවස්ථාවක් දුටු විට **පළමුවෙන් ම** කළ යුතු දෙයක් වන්නේ,


(1) බේරා ගැනීමට තමන් දියට පැනීම. (2) උදවු ඉල්ලා කෑ ගැසීම.

(3) අනතුරක් සිදු වූ බව කිසිවකුට නොදන්වා සිටීම.


(48) ශාක භක්ෂක, මාංස භක්ෂක, සර්ව භක්ෂක යන සත්ත්ව කාණ්ඩයන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) කපුටා, මුවා, කොටියා (2) කොටියා, කපුටා, මුවා (3) මුවා, කොටියා, කපුටා


(49) අයිස් කැටයක් ජල බඳුනකට දැමූ විට දැකිය හැකි නිවැරදි ආකාරය වන්නේ,



(1)



(2)



(3)

(50) වැඩ පහසු කිරීම සඳහා යොදා ගන්නා උපකරණ හා ඒවායේ කාර්යය නිවැරදිව දක්වා **නොමැති** ප්‍රකාශය තෝරන්න.

(1) ඩැහි අඬුව - යමක් තදින් අල්ලා ගැනීමට (2) අඬු මිටිය - කළුගල් කැඩීමට

(3) ටෙස්ටරය - යම් ස්ථානයක විදුලිය තිබේදැයි පරීක්ෂා කර බැලීම.

(51) තම සුවිශේෂී හැකියා යොදා ගනිමින් මිනිසාට උදවු කරන සත්ත්වයා වන්නේ,

(1) බල්ලා (2) කුකුළා (3) බළලා

(52) අතීතයේ දී මුතුන් මිත්තන් වැඩ පහසු කර ගැනීම සඳහා නොයෙකුත් උපකරණ භාවිත කරන ලදී. **සෙක්කුව** පහත සඳහන් කුමන කාර්යය සඳහා භාවිත කළේ ද ?

(1) වළං සෑදීම. (2) තෙල් සිඳීම. (3) කුරක්කන් ඇඹරීම

(53) ගෙවත්තේ බෝග වර්ග අතර දහස්පෙතියා ශාක වගා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

(1) ගෙවත්තට අලංකාරයක් එක් කිරීමයි. (2) බෝගවලට හානි පමුණුවන සතුන් පළවා හැරීමයි.

(3) ගෙවත්තෙහි ඉඩකඩ උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීමයි.

(54) මෙම උපකරණ භාවිත කරන කර්මාන්ත පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,





(1) පෙදරේරු සහ වඩු කර්මාන්තය (2) කම්මල් සහ කෘෂි කර්මාන්තය

(3) කෘෂි කර්මාන්තය සහ වඩු කර්මාන්තය

(55) වගාව ට හානි කරන කුරුල්ලන් හා වෙනත් සතුන් පලවා හැරීමට භාවිත කරන ඇටවුමකි,

(1) බඹර රෝදය (2) ජල රෝදය (3) සුළං ටකය

(56) උඩරට නැටුම් කලාවේ තුරඟා වන්නමෙන් සහ ගජගා වන්නමෙන් කියැවෙන සතුන් පිළිවෙළින්,

(1) හාවා සහ ඇතා (2) වඳුරා සහ නයා (3) අශ්වයා සහ ඇතා

(57) තවාන් මගින් පැළ ලබා ගන්නා ශාක පමණක් ඇති පිළිතුර වන්නේ,

(1) වම්බටු , මාළුමිරිස් (2) බතල, නිවිති (3) බණ්ඩක්කා, බෝංචි

(58) ඇස හා කණ උපයෝගී කර ගෙන තොරතුරු ලබා ගත හැකි සන්නිවේදන උපකරණයකි,

(1) ගුවන් විදුලිය (2) රූපවාහිනිය (3) ශබ්ද විකාශන යන්ත්‍රය

(59) ජාතික කොඩියේ ඇති වර්ණ වන්නේ,

(1) තැඹිලි, කොළ, දම්, නිල් (2) රතු, නිල්, කොළ, කහ (3) රතු, කහ, කොළ, තැඹිලි

(ලකුණු 1 x 30 = 30)

(60) සුන්දර ස්ථාන අතරින් මුහුදු වෙරළේ සුන්දරත්වය ඉතා අගනේ ය. එහි සුන්දරත්වය කියා නිම කළ නොහැක. ලොකු කුඩා සියලු දෙනා ම එක සේ සතුටු වීමට කැමති **"සුන්දර මුහුදු වෙරළේ සැන්දෑවක්"** යන මාතෘකාව යටතේ අක්ෂර වින්‍යාසය සහ උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි වාක්‍ය තුනක් ලියන්න. එක් වාක්‍යයක වචන පහකට වඩා වැඩි විය යුතු ය.

(i) .....

.....

(ii) .....

.....

(ii) .....

.....

(ලකුණු 2 x 3 = 06)

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026

පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 03

I පත්‍රය

පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
01.	2
02.	3
03.	3
04.	3
05.	1
06.	2
07.	1
08.	2
09.	1
10.	2
11.	1
12.	3
13.	2
14.	3
15.	2
16.	2
17.	3
18.	3
19.	3
20.	1

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය
21.	1
22.	3
23.	2
24.	2
25.	1
26.	1
27.	3
28.	2
29.	3
30.	1
31.	1
32.	3
33.	3
34.	3
35.	2
36.	1
37.	1
38.	2
39.	3
40.	2

ශිෂ්‍යත්ව ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2026




පෙරහුරු ප්‍රශ්න පත්‍රය

කට්ටල අංක 03

II පත්‍රය

පිළිතුරු

01.	i	ප්‍රධානාචාර්යතුමා			
	ii	නොසිතුවෙමි / කීවෙමි/ වීමි / කළෙමි			
	iii	උගැන්මෙහි සමත්, කීකරු දරුවෙකු නිසා			
	iv	අනෙක් ළමයින් දෙදෙනා වේවැල් පාර කනු දැකීම			
	v	දයාව / කරුණාව	vi . සඟවාගෙන / දඬුවම් / හඬන්නේ		
02.		3 කැඩුවේ ය			
03.	1.	කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ			
	2.	කෙටි පාපිල්ල / කෙටි ඇද පාපිල්ල			
04.	I.	X	II. √	III. X	IV. X
05.	1.	ණ	II. ළ	III. න	IV. ල
06.		යම් අපහසුතාවයකින් හෝ කරදරයකින් මිදීමට කරන ක්‍රියාවෙන් වඩාත් කරදරයට හා අපහසුතාවයට පත්වීම			
07.		විශාල සතුටක් ඇතිවීම			
08.	I.	ළමයි	II. නංගී	III. තාත්තා	
09.	I.	පාසල් භූමියේ කෙළවරක ඉතා විශාල ක්‍රීඩා පිට්ටනියකි.			
	II.	නිවස ඉදිරිපස ඇති බිම් කොටස හරි ම අපූරුය.			
10.	I.	Peacock	II. bicycle		
11.	I.	දේදුන්න	II. වට්ටක්කා		
12.	I.	He is nine years old.			
	II.	How much is a pen ?			
13.		වැසිකිළිය			
14.		නාන් වෙළියේ පෝහළාමා ?			
15.		7000			
16.		2098, 2100			
17.		4698, 4896 , 4986			
18.		3 kg 400 g			
19.		1712			
20.	I.	චතුස්තලය	II. 4		
21.	I.	186, 182	II. 495, 490		
22.		100+100+50+20+5			
23.		8 l 050 ml			
24.		රුපියල් 374.50			
25.		7 m 55 cm			

26		i 	ii 		
27.					
28.					
29.	i.	දොඩම් සහ අඹ	ii 11		
		30. 3	31. 2	32. 3	33. 1
		34. 1	35. 2	36. 1	37. 2
		38. 1	39. 1	40. 2	41. 3
		42. 1	43. 2	44. 2	45. 3
		46. 3	47. 2	48. 3	49. 3
		50. 2	51. 1	52. 2	53. 2
		54. 1	55. 3	56. 3	57. 1
		58. 2	59. 3		
60.		උක්ත ආඛ්‍යාතය සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි එක් වාක්‍යයකට වචන පහකට නොඅඩු වාක්‍ය 3 ක් තිබිය යුතුය.			
		පැහැදිලි බව සහ අත් අකුරු සඳහා ලකුණු 02 මුළු ලකුණු 100			